මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PRE/2024/01** **2024.07.26**

## ජනාධිපතිවරණය - 2024

### නාමයෝජනා පත්‍ර භාර ගැනීම, ඇප තැන්පත් කිරීම සහ ඡන්ද විමසීම

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 2 වැනි සහ 8 වැනි වගන්ති**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා වන ඡන්ද විමසීම 2024 සැප්තැම්බර් මස 21 වැනි දින පැවැත්වීමට නියමිත බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. එම ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා පත්‍ර භාර ගැනීම 2024 අගෝස්තු මස 15 වැනි දින පෙ.ව. 9.00 සිට පෙ.ව.11.00 දක්වා කාල සීමාව තුළ රාජගිරිය, සරණ මාවතේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සිදු කරනු ලැබේ.

03. භාර දෙනු ලබන නාමයෝජනා සම්බන්ධයෙන් එදින එනම් 2024 අගෝස්තු මස 15 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.30 දක්වා කාලසීමාව තුළ විරෝධතා දැක්විය හැකි ය. යම් ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයකු විසින් හෝ ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාගේ නාමයෝජනා පත්‍රය අත්සන් කළ තැනැත්තා විසින් මෙම විරෝධතා ඉදිරිපත් කළ හැකි ය.

04. නාමයෝජනා භාර දෙනු ලබන සෑම අපේක්ෂකයකු විසින්ම නාමයෝජනා භාරදීමට පෙර නියමිත ඇප මුදල් තැන්පත් කර තිබිය යුතු ය. පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකු වෙනුවෙන් රු.50,000/-ක මුදලක් ද අනෙකුත් අපේක්ෂකයකු වෙනුවෙන් රු.75,000/- ක මුදලක් ද ඇප වශයෙන් තැන්පත් කළ යුතු ය.

05. මෙම ඇප මුදල් භාරගැනීම 2024 ජූලි මස 26 දින වූ අද දින සිට, නාමයෝජනා දිනයට පෙර දින වූ, එනම් 2024 අගෝස්තු මස 14 දින මධ්‍යාහ්න 12.00ට පෙර අතර වූ කාලය තුළ, කාර්යාල දිනවල දී පෙරවරු 8.30 සිට ප.ව. 4.15 දක්වා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී, මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් භාරගනු ලැබේ.

06. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාමයෝජනා කරනු ලබන අපේක්ෂකයින් හැර අනෙකුත් අපේක්ෂකයින් ඇප මුදල් භාරදීමේ දී, ව්‍යවස්ථාදායකයේ තෝරා පත්කර ගනු ලැබූ මන්ත්‍රීවරයකු බව හෝ මන්ත්‍රීවරයකුව සිටි බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් මගින් සනාථ කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් වේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)